සිංහල සංදේශාවලියෙහි මුදුන් මල්කඩ
සැළලිහිණි සංදේශයයි 1

දයා විජේසූරිය
බෙරික් - මෙල්බර්න්

බෙරික් - මෙල්බන්හි ඉසිඹුලන හුදකලාවේදී මගේ පාසැල් දිවියේ අටවැනි ශ්‍රේණියේදී හැදෑරූ සැළලිහිණි සංදේශයේ මා සිත් ගත් කවි කිහිපයක් පිළිබඳව මගේ මතකය අවදි විය. සැළලිහිණිය පිළිබඳව විමසමින් කවිවල රසාස්වාදය විඳිමින් මෙම ලිපිය සකස් කෙරිණ.

කෝට්ටේ 6 වැනි පැරකුම්බා රජ සමය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගයක් විය. රජතුමා සාහිත්‍යකාමියෙකු වීම එයට එක් හේතුවක් විය. මෙකල ලියවුණු සාහිත්‍ය ග්‍රන්ථ අතරට නව සාහිත්‍ය අංගයක්ද එකතු විය. එනම් සංදේශ කාව්‍යයයි. සංස්කෘත සාහිත්‍යයෙහි කාලිදාසයන් විසින් අප්‍රාණික වස්තුවක් වූ මේඝය හෙවත් වලාකුලක් දූතයා වශයෙන් ගෙන මේඝදූතය නමැති සංදේශ කාව්‍යය ලියා ඇතත් සිංහල සිහිත්‍යයේ සප්‍රාණික සතුන් දූතයන් වශයෙන් ගෙන සංදේශ ලියා ඇත.

මේ අනුව කෝට්ටේ යුගයට අයත් සංදේශ වශයෙන් සැළලිහිණි සංදේශය, ගිරා සංදේශය, තිසර සංදේශය, මයුර සංදේශය, හංස සංදේශය, සැවුල් සංදේශය සඳහන් කළ හැකිය. මෙකල කාව්‍ය රචනයෙහි යෙදුන භික්ෂූන් වහන්සේලා වශයෙන් තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, විදාගම මෛත්‍රිය හිමි, වෑත්තෑවේ හිමි, වනරතන හිමි සඳහන් කළ හැකිය.

ශඩිභාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කරන ලද සැළලිහිණි සංදේශය, කෝට්ටේ යුගයේ ලියවුණු සංදේශ කාව්‍යයන් අතර ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකිය හැකිය. කෝට්ටේ රාජධානිය කරගත් 6 වැනි පැරකුම්බා රජුගෙන් පසුව රාජ්‍යයට උරුමක්කාරයෙක් නොසිටි බැවින් තමාගේ දියණිය ලෝකනාථා හෙවත් උලකුඩය දේවියට පුත්‍රයෙකු ලබාදෙන ලෙස ආයාචනා කරමින් කැළණියේ විභීෂණ සුරිඳුන් වෙත යසුනක් යවනුයේ සැළලිහිණියෙකු සංදේශ භාරකයා හෙවත් දූතයෙකු ලෙස යොදා ගනිමිනි. සැළලිහිණි සංදේශය රචනා කිරීමේ පරමාර්ථය මෙයයි.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමි සහ පැරකුම්බා රජ පවුල අතර පැවති සබැඳියාව පිළිබඳ තොරතුරුද මේ මගින් හෙලි වේ.

සංදේශ කාව්‍යයන්ගෙන් සමකාලීන ආගමික, දේශපාලනික, ආර්ථික, සාමාජික මෙන්ම ඓතිහාසික තොරතුරුද දැනගත හැකිය.

සංදේශ කාව්‍යයන්ට අයත් අංගයන් වන දූතයාට ආශිර්වාද කිරීම, දූත වර්ණනාව, සුභ නැකතකට පිටත් වීම, පෙරමග සුභ ලකුණු බැලීම මෙන්ම නගර වර්ණනා රාජ වර්ණනා උයද වර්ණනා, සන්ධ්‍යා වර්ණනා, වන වර්ණනා, පුර වර්ණනා, මාර්ග වර්ණනා මෙන්ම දූතයාට ගමන් මග හෙළි කිරීම, තමා කළ යුතු කාර්ය පිළිබඳ දැනුවත් කිරීම ආදී අංගයන් දක්නට ලැබේ.

මේ අනුව සැළලිහිණි සංදේශයෙහි මෙම ලක්ෂනයන් පිළිබඳව විමසා බලමු. පළමුවෙන්ම දසපද හෑල්ලකින් යුතුව දූතයාට ආශිර්වාද කිරීම හා දූතයා වර්ණනා කිරීම කතුවරයා ඉතාම රමණීය භාෂාවක් යොදා ගනිමින් සිදු කරයි.

සැරද සුල කළ කුරු
මියුරු තෙපලින් රඳනා
රජ කුල රහස මැතිණිය
සිය නිහි සැළලිහිණි සඳ
ලප නොමවන් සඳවන් සොම් ගුණ ගිහිණී

සියනිහි කැලන් සමගින
එබැවින් නුබින් එනවර
නිලූ ද ලද සිඳඹුවො දිගු වරල නිලූ
නිලූ ද වන දෙව් ලියො දිගු වරල නිලූ

සැරදේවා! යන ආමන්ත්‍රණයෙන් යුතුව, ඉතා අලංකාරවත් පියාපත් වලින් යුතු, මිහිරි වචන කථා කරන, රිජ පවුලෙහි රහස් මන්ත්‍රණය කරනු ලබන, සැළලිහිණි චන්ද්‍රයාණෙනි, යෙහෙන් වැජඹේවා ! යනුවෙන් ආශිර්වාද කරයි.

ලප නැති චන්ද්‍රයා මෙන් සෞම්‍ය ගුණයෙන් යුක්ත වූ තමාගේ ඥාතීන් සමග අහසින් එන කල්හි සිධංගනාවන් සහ වන දෙව් ලියන් මලක් යයි සිතා දිගු වරලසෙහි ගසා ගැනීමට නෙලා ගත්තේ නැද්ද යනුවෙන් අසයි.

මීලඟට තමාගේ කාර්ය සඳහා දූත ගමනෙහි යෙදෙන විට පළමුවෙන්ම සුභ නැකතින් ගමන ආරම්භ කිරීමට පවසන අතර පෙරමග සුභ නිමිති බැලීමට කියයි.

සැළලිහිණියෙහි මෙම කවියෙන් එය විස්තර කෙරේ.

නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙල කුසුම ලිය පිය තෙපල රන් කෙඩි
සල සුදු සෙමෙර සේසත් ගිජිඳු නොද වැඩි
බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි

සුවඳවත් වූ මඳ සුලඟ, පිරුණාවූ කලගෙඩි, මිහිරි රසැති අඹගෙඩි, පිපුණු සුදු නෙළුම්, ප්‍රිය වචන කථා කරන ස්ත්‍රීන්, සෙලවෙන සුදු චාමර, සේසත්, තරුණ ඇතුන් යනුවෙනි.

මීලඟට ගමන පිටත් වීමට පෙර ජයවර්ධන පුරය ගැන විස්තරයක් කරයි.

පොහොසත් දන ඇති තුණු රුවන බැති පෙමා
මුළු වද්දන සුරපුර පිරි සිරින් හැමා
ජයවද්දන කෙරුමෙන් සුසැදු තම නමා
ජයවද්දන පුරවර දනු මිතුරු තුමා

තුණු රුවන් කෙරෙහි භක්තියෙන් යුතු, පොහොසත් ජනයාගෙන් පිරි, සවි සිරියෙන් පිරුණාවූ දෙව්ලොව පරදන ජය වර්ධනය කිරීමෙන් තමාගේ නම ප්‍රසිද්ධියට පත් කළ ජයවර්ධන පුරය දැනගන්න මිතුර යනුවෙනි.

මී ලඟට සැළලිහිණියාට ගමන පිටත් වීමට පෙර දළදා වහන්සේ වැඳීමට කියයි.

ලොව විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමඳා සිරි සඟ මොක් සැප නි සැදී
ලද මුනිදා දම්කඳ පහස මන බැඳී
වඳු දළදා හිමි තෙමහල් පහය රැඳී

ලොව පුරා විහිදුවාවූ සුදු පැහැති සඳ එළිය වැනි නොමඳව සමගි මෝක්ෂ සැප ලබා දෙන, බුදුරාජාණන් වහන්සේගේ සිතෙහි බැඳුනාවූ, ධර්ම ස්කන්ධයෙහි ස්පර්ශය ලැබුවාවූ දළදා හිමි තුන් මහල් ප්‍රාසාදයෙහි වැඩ හිඳී. එය වඳින් යනුවෙන් විස්තර කරයි.

මේ අනුව කෝට්ටේ රජ සමයෙහි තුන් මහල් ප්‍රාසාදයක දළදා වහන්සේ වැඩ සිටි බවට ඓතිහාසික කරුණු අනාවරණය වෙයි.

මී ලඟට පරාක්‍රමබාහු රජතුමාග ගැන වර්ණනාවක් කරමින් එතුමා බැහැදැක, ගමන පිටත් වීමට එතුමාගෙන් අවසර ගැනීමටද, දූතයාට පවසයි.

රිවි බිම්බා යුරු රිවි කුල කමල කර
පියුමම්බා නිතොරව රැඳි උර මැ දුර
මෙන රම්බා හිමි රූ සිරිනි පැහැ සර
පැරකුම්බා නරනිඳු සඳ දකු මි තුර

සූර්ය වංශය නමැති නෙළුම් විලට හිරු මඬල වැනි වූ උරමැදුරෙහි නිතරම පියුමම්බා හෙවත් ශ්‍රී කාන්තාව රැඳුනාවූ රම්බා දෙවඟනගේ ස්වාමියා මෙන් රූපශ්‍රීයෙන් යුක්තවූ පැරකුම්බා නරේන්ද්‍ර චන්ද්‍රයා දකින්න මිතුර යනුවෙන් පැරකුම්බා රජු ගැන විස්තර කරනුයේ උචිත උපමා, රූපක හා එළිසමය හා අනුප්‍රාස යොදා ගත් කාව්‍යමය අලංකාර වලින්යුතු කවියකිනි.

මීලඟට රජුගෙන් අවසර ගන්නා ලෙස දූතයාට පවසන්නේ මෙසේය.



උණුනොව බරණ සිව් සැට
වොටුණුත් පැළඳ
වෙණුවෙන් පසක් උන් සඳ සීහසුන් මැද
මනු රජ කුලෙන් පැවතෙන
පිළිවෙළ නො සිඳ
ගනු අවසරය එනිරිඳු සිරි පතුල් වැඳ

අඩුවක් නැතිව හැට හතරක් රාජාභරණවලින් සැරසී ඔටුන්නක් පැළඳගෙන ප්‍රත්‍යක්ෂ විෂ්ණු මෙන් සිංහාසනය මත වැඩහිඳින මනුරාජ කුලෙන් පැවත එන පැරකුම්බා රජුගෙන් අවසර ගනුව යනුවෙන් පවසයි.

මී ලඟට ජයවර්ධන පුරය අවට ඇති දියවන්නා ඔය ගැන වර්ණනාවක් කරයි.

සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
විදි දිය දහර ලෙල දෙන දිගු නරු පටැති
රැඳි රළ රළැතිහොය දියවන්නා නමැති
ඇඳි පුර අඟන පට සළු සිරි රැපැයි නිති

රතු නෙළුම් මල් වලින් සහ රූපශ්‍රීයෙන් යුත් රනහංස පේලි වලින් යුක්තවූ විහිදී යන ලෙල දෙන දිය දහරින් හා රළ පංතියෙන් යුත් දියවන්නා ඔය ජයවර්ධන පුරය නැමැති අංගනාව විසින් අඳින ලද පටසළුවක ශෝබාව උසුලයි යනුවෙන් පවසන කතුවරයා ලෙල දෙන දිය දහර හා රළ පන්තිය පුර අඟන විසින් අඳින ලද පට සලුවේ නෙරියට උපමා කර ඇත. මුල සහ අග එළිසමය යොදා ගනිමින් උචිත උපමා චන්දස් අලංකාර අනුප්‍රාසය සහිතව මෙම දියවන්නා ඔය ගැන වර්ණනාවක් කරයි.
මී ලඟට සන්ධ්‍යා වර්ණනාවකට මගපාදා ගන්නා කතුවරයා කොන්ත ගං තොට පිළිබඳව වර්ණනාවක් කරයි.

පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්
පරව තඹර පෙති ගිලි දිය තලා පිටින්
තරව සිහි ඇතිව පරතෙරට යන අටින්
කරව පියාසර සකි කොන්ත ගං තොටින්

අවට පිපුණාවූ කුමුදු මල් සඳරැස් පොරවාගෙන ඇත. පරවී වැටුනාවූ නෙළුම් මල් පෙති ගසාගෙන යන දියතලාවෙන් යුක්තවූ කොන්ත ගං තොටින් හොඳ සිහියෙන් යුතුව එතෙර වීමට යන කල්පනාවෙන් පියාසර කරන්න යනුවෙනි. පොරව, පරව, තරව, තරව යන අනුප්‍රාසයෙන් යුතු වචන වලින් කවියේ මුල සහ අග එළිසමය යොදාගෙන මනස්කාන්ත දර්ශනයක් මවා පායි.

කොන්ත ගං තොටින් එතෙර වන සැළලිහිණියාට රාත්‍රියේ ඉසුරු කෝවිලෙහි ලගින ලෙස පවසන කතුවරයා කෝවිල තුල පැවැත්වෙන පුද පූජා පිළිබඳ දර්ශනයක් මවා පායි.

කළුවැල් කපුරු දුම තුල ලෙලන දද පෙළ
සුවිසල් මිහිඟු සක්සන් මිණි හඬ පතළ
කැර ලොල් සතන් පවසන තියු ගී දෙමළ
මනකල් ඉසුරු කෝවිල ලගිනේ ලකළ

දල්වන ලද කපුරු හඳුන්කුරුවල කළු පැහැති දුම් වැල් අතර කොඩි පෙළ ලෙල දෙයි. විශාල මිහිඟු බෙර හක්ගෙඩි නාදය හා මිණිගෙඩි හඬවන නාදය පැතිරී ඇත. දෙමළ ජනයා රැස්වූ ජනයාගෙන් සිත් පිනවන ආකාරයට ස්තෝත්‍ර ගීත ගායනා කරති. මෙවැනි සිත් අලවන දර්ශනයෙන් යුත් ඉසුරු කෝවිලේ ලගින්න යනුවෙන් දූතයාට පවසයි.

මීලඟට පසුදින හිරු උදාවන අවස්ථාව සැළලිහිණි කතුවරයා මනා චිත්‍රයකින් මවා පෙන්වයි.

උදාගිරි කසුන් රිටි වැට හිස බැබලී
එදා සහසකර පහනෙව් කරන හෙලී
යොදා නුවන් ඉසුරුට කරන පුද කෙලී
විදා පියා නිලඹර යන් නොවී මැලී

උදාගිරි පර්වතය මුදුනෙහි රත්රන් රිටි වැට මත බැබලුනාවූ පහනක් මෙන් එදා සූර්යයා නැග එද්දී ඊශ්වර දිව්‍ය රාජයාට කරන පූජාවන් ද බලා පියාපත් විහිදා නිල් අහසට නැගී කම්මැලි නැතිව පියාඹා යන්න යනුවෙන් උචිත උපමා යොදා ගනිමින් විස්තර කරයි.

මතු සම්බන්ධයි

8 වන පිටෙන්

වැනි ප්‍රගතිශීලී කණ්ඩායම් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තියට එරෙහිව දක්වන විරෝධයයි.

1951 "මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත" මේ වගන්තිය යටතේ මුළුමණින් පිළිගැනේ. ඒ අනුව, මුස්ලිම් නොවන ගැහැනුන් සහ ගැහැනු දරුවන් භුක්ති විඳින වැදගත් ව්‍යවස්ථාමය ආරක්ෂාවන් සහ අයිතිවාසිකම් සමහරක් මේ වගන්තිය යටතේ මුස්ලිම් කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට අහිමි කෙරේ. උදාහරණයක් වශයෙන්, ලංකාවේ තරුණියකගේ විවාහ වීමේ අවම වයස් සීමාව අවුරුදු 16 ක් වෙතත්, අවුරුදු 12 ක් වයසැති මුස්ලිම් ගැහැනු දරුවෙකුව මේ වගන්තිය යටතේ විවාහ කර දිය හැක. ඊටත් වඩා අඩු වයසැති ගැහැනු දරුවෙකුව වුව, මුස්ලිම් විශේෂ අධිකරණයක අවසරය යටතේ විවාහ කර දිය හැක.

මාධ්‍ය වාර්තා කරන අන්දමට, සම්ප්‍රදායික මුස්ලිම් දේශපාලනික සහ ආගමික නායකයන් මේ 16 වැනි වගන්තියේ කිසි වෙනසක් ඇති කරනවාට විරුද්ධ ලු. එහෙත් ළමා විවාහ, අපරාධයක් සේ සළකා නීති පනවා ගත් මුස්ලිම් රටවල් අනන්තවත් තිබේ. (එක්සත් ජාතීන්ගේ මූලාශ්‍රවලට අනුව, ඇල්ජීරියාව, බංග්ලාදේශය, ජෝර්දානය, ඉරාකය, මැලේසියාව සහ මොරොක්කෝව යන රටවල ගැහැනියක් විවාහ වීම සඳහා සපිරිය යුතු අවම වයස අවුරුදු 18 කි. ටියුනීසියාවේ එය අවුරුදු 20 කි). මෙය දැන් ලංකාවේ මහජන කතිකාවට ලක්ව තිබේ. ඒ, ජාතීන් බෙදා වෙන් කරන සටන් පාඨයක් වශයෙන් හෝ ජාතිවාදී අපහාසයක් වශයෙන් පාවිච්චි කිරීමට නොව, ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය තුළ ඇති වී තිබෙන විවෘත සංවාදයේ බරසාර මාතෘකාවක් සේ සැළකිල්ලට ගැනීමටයි.

පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ අළුත් ව්‍යවස්ථාවක් පිළිබඳ බිල්ලෙකු මවා පෑම සඳහා පසුගියදා මල්වතු මහ නාහිමියන් බැහැදුටුවේය. භීතිකා රෝගය බෝ කරමින්, මතිභ්‍රමයට යට නොවන්නැයි, එහිදී උන්වහන්සේ ඔහුට අනුශාසනා කළ බව මාධ්‍ය වාර්තා කෙළේය. මේ දක්වා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයෙන් යුතුව සිදුවන නිසා බිය වීමට කාරණා නැතැයි උන්වහන්සේ ඔහුට පෙන්වා දී තිබේ.

එවැනි අනුශාසනාවන්ට කන්දීම වීරවංශට හුරු පුරුද්දක් නොවේ. ඔහු සහ ඔහුගේ රාජපක්ෂ හාම්පුතුන්ට ලංකාවේ අනාගතයක් ඇත්තේ, ශ්‍රී ලංකාව අතීතයේ නරා වළට වැටුණොත් පමණි. යළි බලය ලබා ගැනීමේ රාජපක්ෂ සිහිනය සැබෑ විය හැක්කේ, රටේ ජනතාව මතිභ්‍රමයේ සහ භීතිකා රෝගයේ මඩ වළට වැටුණොත් සහ රටේ නායකයන් විද්‍යාව අතහැර, සාමාන්‍ය බුද්ධිය පසෙක ලා, මිථ්‍යාමතික නිවාරණයන්ට ගොදුරු වී, ඒකාධිපති විසඳුම් බදා ගතහොත් පමණි.

2016 සැප්තැම්බර් 18 වැනි දා කලම්බු ටෙලිග්‍රාෆ් වෙබ් අඩවියේ පළවූ "Avoiding Superstitious Cures· Defeating Dictatorial Solutions" නැමැති ලිපියේ සිංහල පරිවර්තනය යහපාලනය ලංකා